ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 පෙබරවාරි 28 |

## මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීම පිළිබඳ යාවත්කාලීන කිරීම - 2014 පෙබරවාරි

මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රයත්නය 2014 පෙබරවාරි මාසයේදී සාර්ථක අයුරින් ඉදිරියට යන ලදී.

- **විදේශීය බැංකු නියෝජිතයන් මුණගැසීම:** විදේශීය බැංකුවල කලාපීය නියෝජිතයන් සහ ඉහළ කළමනාකාරිත්වය සමග වෙන් වෙන්ව රැස්වීම් සංවිධානය කරන ලද අතර, එහිදී විදේශීය බැංකු රටේ ආර්ථික කටයුතු වලට වඩා සක්‍රියව දායක වීමට එකඟ වන ලදී.

- **නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී සහ ඩීඑෆ්සීසී බැංකුව ඒකාබද්ධ වීම:** මේ සම්බන්ධව 2014 ජනවාරි මස නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනයට අනුකූලව මෙම බැංකු දෙක ඒකාබද්ධ වීම අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

- **යථා තත්ත්ව පරීක්ෂණ:** යථා තත්ත්ව පරීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා රාමුවක් ස්ථාපනය කරන ලද අතර බැංකු, මූල්‍ය සමාගම් සහ කල්බදු සමාගම් විගණනය කිරීම සඳහා බලයලත් විගණන ආයතන අදාළ සමාගම්වල යථා තත්ත්ව පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.

- **නියාමන අධිකාරීන් අතර සහයෝගීතාවය:** ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂම සහ කොළඹ කොටස් වෙළෙඳපොළ අපේක්ෂිත ඒකාබද්ධ කිරීම් වලට පහසුකම් සැපයීමට කඩිනම් ක්‍රියාවලියකට යොමුවීමට එකඟ වී ඇත.

- **බදු සම්බන්ධ කාරණා:** ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේදී පැන නැගිය හැකි යැයි අපේක්ෂා කරන බදු ආශ්‍රිත කාරණා වලදී මැදිහත්වීමට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එකඟ වන ලදී. එලෙසම ඔවුන් අයවැයේදී මේ සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කරන ලද යෝජනා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නීති සම්පාදනය කරමින් පවතී.

- **දැනුවත් කිරීමේ වැඩසටහන්:** ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීහු ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙලට අදාළ දැනුම හුවමාරු කර ගැනීමේ විවිධ වැඩසටහන් වලට සහභාගි වූහ. මෙකී වැඩසටහන් තුළදී මෙම ක්‍රියාදාමයට සම්බන්ධිත කොටස්කරුවන් විසින් මතු කරන ලද කරුණු කාරණා වලට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් උදාවන ලදී.

මේ අතරතුර, ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන ඒකාබද්ධකරණ ක්‍රියාවලිය සහ එමගින් අපේක්ෂිත පද්ධතිමය ස්ථායීතාවය ඉහළයාම හා දිගුකාලීන ආර්ථික වර්ධනය කඩිනම් වීම පිළිබඳව පළ කර ඇති ධනාත්මක මත ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානයට යොමු වී ඇත. මීට අමතරව, ඇතැම් ජාත්‍යන්තර ආයතන මෙම මූල්‍ය පද්ධතිය ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේදී අරමුදල් සහ උපදෙස් සැපයීමට කැමැත්ත ප්‍රකාශ කර තිබීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානයට ලක්වී ඇත.